INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

# කාන්තාවන්ට එරෙහි වෙනස්කම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් 2017 පෙබරවාරියේ කරන පරීක්ෂණයට ඉදිරිපත් කරනු ලබන ප්‍රසිද්ධ ලියැවිල්ල

**දිනය:** 2017 ජනවාරි 23


W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA


**සාරාංශය**


ශ්‍රී ලංකාවේ ආරක්ෂක බලඇණි විසින් යුද ගැටුමට අදාළව සිදුකරන ලද වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් දණ්ඩ මුක්තිය ආයතනගතව පවතින ආකාරයත් අද දක්වාත් කෙලෙසීම් සිදුකෙරෙමින් පවතින ආකාරයත් කෙරෙහි මේ ලියැවිල්ල යොමු වෙයි. රජයේ අත් අඩංගුවේ සිටියදී විඳවූ වධහිංසා සහ භයංකර අඩන්තේට්ටම් විස්තර කරමින් කාන්තාවන් 55ක් ලබාදුන් දිවුරුම් පෙත්සම් මේ ලියැවිල්ලට ආධාරක වශයෙන් ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) සතුව ඇත. එයින් 48 දෙනකු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ පාලනය යටතේද හත් දෙනකු[1] වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ගේ පාලනය යටතේද රඳවා සිටි අයයි. වධහිංසා පැමිණවීම සඳහා ලිංගික ප්‍රචණ්ඩතාව යොදාගැනීමේ ප්‍රතිපත්තියක් හිතාමතාම පවත්වාගෙන යන බව[2] එක්සත් ජාතීන්ද ඇතුළු සංවිධාන නගා ඇති විශ්වසනීය චෝදනා විභාග කරන්නට වසර දෙකකට ඉහතදී බලයට පත්වූ දිනයේ සිට ජනාධිපති සිරිසේන සහ ඔහුගේ ආණ්ඩුව සමත් වී නැත. විමර්ශන නොකර සිටීමෙන්ද, වගකිව යුත්තන්ගේ වගවීම ඉටු නොකිරීම ද ඇතුලු කටයුතු මගින්ද, දැනටත් සිදුවෙන කෙලෙසීම් වැලක්වීමට පියවර නොගැනීමෙන්ද සිරිසේන ආණ්ඩුව ප්‍රචණ්ඩතාව දිගටම පවත්වාගෙන යාම පිළිබඳ අපරාධ සහායකත්වයක් දරයි. කාන්තාවන්ට වධහිංසා පමුණුවා ලිංගික දූෂණය කිරීමට සෘජුව සම්බන්ධ වී සිටීමේ සහ/ හෝ විධාන වගකීම දැරීමේ චෝදනා එල්ලවන ශ්‍රී ලංකා පොලිස්


---

1. ආණ්ඩු දෙකේම කාලය හරහා යන එක සිද්ධියකදී පැහැරගැනීම රාජපක්ෂ සමයෙහි ලා ගැනෙන නමුත්, සිරිසේන පාලනය යටතේද රඳවාගෙන වධහිංසා පමුණුවා තිබේ.
2. A/HRC/30/CRP.2, "... ලිංගික ප්‍රචණ්ඩතා යනු හුදෙකලා ක්‍රියා නොව තොරතුරු ලබා ගැනීම, අඩන්තේට්ටම් කිරීම, ගර්භා කිරීම සහ බිය ගැන්වීම සඳහා වධ බන්ධන පැමිණවීමේ දැනුවත් ප්‍රතිපත්තියක් බවයි. පැතිර පිහිටි රඳවා ගැනීමේ ස්ථාන වලදී ඒකාකාර උපකරණ, කාල පරිච්ඡේද සහ ආරක්ෂක හමුද භාවිතය සහිත එක සමාන රටාවකින් තහවුරු කෙරෙන්නේ මෙය ආරක්ෂක හමුද විසින් පවත්වාගෙන යනු ලැබූ ආයතනගත ප්‍රතිපත්තියක අංගයක් බවට වන නිගමනයයි." (591 ඡේදය)

හා හමුදා නිලධාරීන් ගණනාවක් ITJP විසින් හඳුනාගෙන තිබේ. කෙසේ වෙතත්, මේ පුද්ගලයන්ගේ වගවීම සහතික කිරීමේ දේශපාලන අභිලාෂය ආණ්ඩුව සතුව නැති හෙයින් දණ්ඩ මුක්තිය ශ්‍රී ලංකාවේ ආයතනගතවද, නිදන්ගතවද පවතී.

**සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (I TJP)**

2013 දෙසැම්බරයේ ITJP ය පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියර වූ 2009 දීත් ඉන් අනතුරුවත් යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ පිළිබඳව හෙළි වෙමින් පැවති සාක්ෂි සම්බන්ධයෙන් දැක්වුනු ප්‍රතිචාරයක් ලෙසිනි. එම ව්‍යාපෘතිය එහි අධ්‍යක්ෂිකා සංක්‍රාන්තික යුක්ති විශේෂඥ යැස්මින් සූකා ගේ මග පෙන්වීම ඔස්සේ මානව හිමිකම් පදනම යටතේ පරිපාලනය කෙරේ. වධහිංසාවෙන් සහ/ හෝ ලිංගික ප්‍රචන්ඩතාවට ගොදුරුවී රටින් පලා ආ අයගෙන් ITJP ප්‍රකාශ ලබා ගනී. පැහැරගැනීම්, වධබන්ධන, ලිංගික කෙලෙසීම් වලට අදළ වාර්තා තුනක් ද [2014 මාර්තු, 2015 ජූලි, 2015 ජනවාරි] සංක්‍රාන්තික යුක්තියට අදළව වෙනත් වාර්තාද ITJP විසින් පල කොට තිබේ[3].

## <u>1. පසුබිම</u>

### 1.1 ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය 2015 දී කළ විමර්ශනය (OISL)

රජයේ ආරක්ෂක හමුදා විසින් යුද සමයේත් ඉන් අනතුරුවත් පුළුල් වශයෙන් සිදුකළ වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා පිළිබඳව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය 2015 දී කළ විමර්ශනය (OISL[4]) විසින් වාර්තා කර ඇත. එමගින් සැලකිල්ලට ගෙන ඇත්තේ 2002-2011 කාල පරිච්ඡේදයයි. දිගටම සිදුවන කෙලෙසීම් අධීක්ෂණය කොට වාර්තා කිරීමටද එම වාර්තාව සම්පාදනය කළ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) ට වරමක් තිබේ. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා 2015 සැප්තැම්බරයේ මෙසේ ප්‍රකාශ කළේය: "2015 ජනවාරියේ සිට සිදු කරන ලද වධහිංසා පිලිබඳ සිද්ධි 14ක් විශ්වසනීය මුලාශ්‍ර විසින් අපට වාර්තා කර තිබේ[5]". මේවා ශ්‍රී ලංකාවේ අලුත් ආණ්ඩු පාලනය යටතේ සිදුකරන ලද ඒවායි. OHCHR වෙත එම තොරතුරු ලබාදුන් "විශ්වසනීය" සංවිධාන දෙකින් එකක් වන්නේ ITJP යයි.

### 1.2 OISL වාර්තාවෙන් පසු

ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ විසින් 2015 සහ 2016 දීත් සිදු කරන ලද වධහිංසා සහ ප්‍රචණ්ඩ ලිංගික අපරාධ වලින් පීඩාවට පත් පිරිමින්ගේ සහ ගැහැණුන්ගේ ප්‍රකාශ ITJP විසින් දිගටම ලේඛන ගත කොට තිබේ. නව රජය යටතේ සිදුකෙරුනු සිද්ධි 36[6] සම්බන්ධ සවිස්තර තොරතුරු සඳහා අප විසින් වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවේ 59 සැසියට[7] සපයන ලද

---

3.(a) “An Unfinished War: Torture and Sexual Violence in Sri Lanka 2009 – 2014”, Yasmin Sooka, The Bar Human Rights Committee of England and Wales and the International Truth & Justice Project, Sri Lanka, March 2014.

(b) “A Still Unfinished War: Torture and Sexual Violence in Sri Lanka 2009 – 2015”, International Truth and Justice Project Project, July 2015.

(c) “Silenced: Survivors of Torture and Sexual Violence in 2015”, ”, International Truth and Justice Project Project, January 2016.

4. A/HRC/30/CRP.2

5. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් සෙයිඩ් රාද් අල් හුසේන් වීඩියෝ සබැඳියක් මාර්ගයෙන් මානව හිමිකම් කොමිසමට කළ ප්‍රකාශය, 2015 සැප්තැම්බර් 30.http://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=16539&LangID=E#sthash.XmlbQlxm.dpuf

6. ITJP මාධ්‍ය නිවේදනය, 2016 නොවැම්බර් 14: ශ්‍රී ලංකාවේ තවමත් පවත්වාගෙන යන රහසිගත වධකාගාර වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව (UNCAT) විසින් විමර්ශනයට ලක් කළ යුතුයි. http://itjpsl.com/assets/press/UNCAT-ITJP-press-release.pdf

7. ලියැවිල්ල http://www.itjpsl.com/reports/submission-to-un-committee-against-torture සබැඳියෙන්.
සැ.යු: එහි ඇත්තේ සිද්ධි 33ක් පමණි. අමතර සිද්ධි 3ක් මාධ්‍ය නිවේදනයේ සඳහන් වෙයි.

ලියැවිල්ල බලන්න. එහි සිද්ධි සාරාංශගත කරන වගුවක්[8] සහ වින්දිතයන්ගේ උධෘත සහිත කැළැල් වල ඡායාරූප ඇතුලත් වෙයි[9]. ඒ සිද්ධි 36න් 8ක පීඩාවට පත්ව සිටින්නේ කාන්තාවන්ය[10].

එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබුණු විශ්වසනීය තොරතුරු මත පදනම් වෙමින් වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව (UNCAT)[11] යුද්ධයෙන් පසු කාලයේත් ඊනියා "සුදු වෑන් පැහැරගැනීම්" ශ්‍රී ලංකාවේ දිගටම සිදු කෙරෙන බවට නිගමනය කරමින් (11 ඡේදය), ITJP විසින් හඳුනාගත් වධක පරිශ්‍ර 48ක් පිළිබඳව සඳහන් කර තිබේ[12].

පැමිණි රට පිළිබඳ තොරතුරු රැගත් බ්‍රිතාන්‍ය වාර්තා[13] සහ මානව හිමිකම් පිළිබඳ ඇමරිකා එක්සත් ජනපද වාර්ෂික වාර්තාවල පශ්චාත් යුද පැහැරගැනීම් සහ වධහිංසා පිළිබඳ ITJP ලියකියවිලි බොහෝ වර උපුටා දක්වා තිබේ. 2016 එක්සත් ජනපද වාර්තාව අප විසින් ලේඛනගත කළ සිරිසේන පාලනය යටතේ වූ සිද්ධි 11ක් උපුටා දක්වා තිබේ[14].

**1.3 දණ්ඩ මුක්තිය**

යුද්ධයට අදළව කාන්තාවන්ට එරෙහිව සිදු කොට ඇති වධහිංසා සහ ලිංගික හිංසන සම්බන්ධයෙන් අඛණ්ඩවම දඬුවමෙන් මුදවා තබන අතර, පැවති සියලු ආණ්ඩු විසින් වගකිවයුත්තන්ගේ වගවීම නොතකා හැරීම නිසා දශක ගණනාවක් තිස්සේ දණ්ඩ මුක්තිය නිදන්ගතව පවතී. වධහිංසා සහ/හෝ ලිංගික ප්‍රචණ්ඩතා සිදු කළ, ඊට අණ දුන් හෝ ඉවසා සිටි බවට බරපතල චෝදනා ලබන ආරක්ෂක අංශ වල ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට ජනාධිපති සිරිසේනගේ ආණ්ඩුවත් මැලි වන බව ITJP දන්වා සිටියි. ඊට හේතු මෙසේය:

(i) යුද්ධය අවසානයේදී ගැහැණු, පිරිමි නිරන්තරයෙන් වධබන්ධනයටත්, ලිංගික කෙලෙසීමටත් ගොදුරු කරගත් ශ්‍රී ලංකාවේ අපකීර්තිමත්ම වධකාගාරය පවත්වාගෙන ගිය තැනැත්තා 2016 නොවැම්බරයේ UNCAT 59 වැනි සැසිවාරය හමුවට ආ දූත මණ්ඩල සාමාජිකයකු ලෙසින් ශ්‍රී ලංකා රජය විසින් එවා තිබුනි. මේ තැනැත්තා OISL වාර්තාවේද නම් කරන ලද්දෙකි. මේ පුද්ගලයාගේ චර්යාව සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි තිබේ. කෙසේවෙතත්, එසේ කිරීමේ හැකියාව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් සම්පූර්ණයෙන්ම බැහැර කරන ලදී. එමගින් විදහා දැක්වුණේ, (අ) පසුගිය පාලන තන්ත්‍රයේ සිටියවුන් පවා ඇතුළුව සියලුම නිලධාරීන් භුක්ති විඳින නිර්බාධිත දණ්ඩ මුක්තිය සහ (ආ) බරපතල අපරාධ කළ බවට චෝදනා ලබන රජයේ නිලධාරීන්ගේ සුලමුල සොයා සෝදිසි කිරීමට කැපවෙන බවට මානව හිමිකම් කොමිසම හමුවේ ආණ්ඩුව විසින් කරන ලද ප්‍රකාශය මුසාවක් වීමයි[15]. රටේ විදේශ අමාත්‍යවරයා අඟවා සිටියේ විශේෂ අධිකරණයක් පිහිටවූ කලට

---

8. 2015 සහ 2016 සිද්ධි වගුව http://www.itjpsl.com/assets/ITJP-Chart-2015-and-2016-cases.pdf
9. දිවි ගලවාගත්තවුන් තමන්ගේම මුවින් කී දේ http://www.itjpsl.com/assets/ITJP_scar_photos_v1.2.pdf
10. 2015/ 2016 සිද්ධි සඳහා ITJP වගුව බලන්න http://www.itjpsl.com/assets/ITJP-Chart-2015-and-2016-cases.pdf
11. UNCAT, ශ්‍රී ලංකාව පිළිබඳ පස්වැනි වාරික වාර්තාවේ සමාප්ති නිරීක්ෂණ, 2015 දෙසැම්බර්
12. A Still Unfinished War, ITJP, July 2015, http://www.refworld.org/pdfid/56e2e1584.pdf
13. Sri Lanka COI Query Response- UPDATE, March 2016. Country of Origin Information, http://www.refworld.org/pdfid/56e2e1584.pdf
14. SRI LANKA 2015, Country Reports on Human Rights Practices for 2015, United States Department of State, Bureau of Democracy, Human Rights and Labor, ITJP සම්බන්ධයෙන් 2014 වාර්තාවේ එන උපුටන සඳහා බලන්න: https://www.state.gov/j/drl/rls/hrrpt/2014humanrightsreport/#wrapper
15. *Government not raised against of Sisira Mendis - Ruwan Wijewarden*, 11 December 2016,

මේ සිද්ධිය සම්බන්ධයෙන් පියවර ගත හැකි බවයි; වධහිංසාවට එරෙහිව දැනට පවතින නීති යටතේ ඒ ගැන කටයුතු කළ නොහැක්කේ මන්දැයි විමසන ලදුව ඔහු පිළිතුරු දුන්නේ නීතිපතිවරයා තවත් එවන් සිද්ධි දහස් ගණනකට යටවී සිටින බව පවසමිනි[16].

(ii) බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් අතුරුදහන් කිරීම සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුව විසින් 2015 දී ත්‍රිකුණාමලයේ නාවික කඳවුර අභ්‍යන්තරයේ පිහිටා තිබූ රහසිගත භූගත වධකාගාරය දැක බලා ගන්නා ලදී. ITJP විසින් එය පිහිටි ස්ථානය එයින් මාස හයකට පෙර ප්‍රකාශයට පත් කර තිබුනි[17]. එතැන ගැහැණු හා පිරිමි රඳවාගෙන වධ බන්ධන පමුණුවන ලද මුත් කිසිදු විශ්වසනීය පරීක්ෂණයක් පවත්වා නොමැත. ගත යුතු පියවර ITJP විසින් සවිස්තරව දක්වා තිබුනු අතර දිවි ගලවාගත්තවුන් විසින් පවසන ලද එම ස්ථානය භාරව සිටියවුන්ගේ නම්ද හෙළි කරන ලදී: ඒ කොමඩෝරු රණසිංහ සහ කොමඩෝරු වෙලගෙදරයි. දෙවැන්නා වෙනත් නඩුවක සාක්ෂිකරුවකු ලෙසින් සිටියත් යුද්ධයෙන් පසුව දෙමළ රැඳවියන් රඳවා තබා ගැනීම සහ සහ වද දීම සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් කර ඇති බවක් දැනගන්නට නැත[18].

(iii) UNCAT විසින් පෙන්වා දී ඇති පරිදි (41-2 ඡේද)[19] දැවැන්ත පරිමාණයෙන් ළමා ලිංගික සූරාකෑම සිදුකිරීමේ චෝදනාවට පිටුවහල් කරනු ලැබූ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ ශ්‍රී ලාංකික සොල්දාදුවන් සියයකට වැඩි පිරිස අතරින් අධිචෝදනා නගා වරදකරුවන් කර ඇත්තේ 23 දෙනකු පමනි. රටේ විදේශ අමාත්‍යවරයා අඟවා සිටියේ[20] මේ සිද්ධිය සම්බන්ධයෙන්ද අනාගත විශේෂ අධිකරණයකින් පියවර ගත හැකි බවයි. එහි කිසි තේරුමක් නැත්තේ සැකකරුවන් පිළිබඳව මේ වන විටත් හමුද පරීක්ෂණ මණ්ඩලයකින් විභාග කොට ඇති හෙයිනි.

(iv) සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා දැනට පවතින විධික්‍රමය කොයිතරම් නොසෑහේද කියතොත් එයින් සැබවින්ම සිදුවන්නේ සාක්ෂිකරුවන්ට ඇති අවදානම වැඩි කිරීමකි. ඊට අමතරව විදේශගත සාක්ෂිකරුවන් (එමෙන්ම අනතුරට පත්වීමේ අවදානමකින් යුත් ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ ඥතීන්) හට කිසිදු ආරක්ෂාවක් නැත්තේ තානාපති කාර්යාලයකදී සාක්ෂි දීමට ඔවුන්ට බල කොට ඇති නිසාය. ජාතික

---

Lankaenewsweb at http://lankanewsweb.net/news/item/4869-government-not-raised-against-of-sisira-mendis-ruwan-wijewarden; සෝදිසි කිරීම පිළිබඳව ඇත්තේ එක්සත් ජාතීන්ගේ A/HRC/30/L.29 යෝජනාවේයි. විශ්‍රාම ගොස් සිටි මෙන්ඩිස් මහතා බුද්ධි අංශ ප්‍රධානියා ලෙස සේවය කිරීමට නැවත කැඳවා ගන්නා ලද්දේ අලුත් ආණ්ඩුව විසිනි.

16. විදේශ අමාත්‍ය මංගල සමරවීර ලන්ඩනයේ චැතම් හවුස් මන්දිරයේදී (චැතම් හවුස් රීති යටතේ නොවේ) ප්‍රශ්න වලට පිළිතුරු දුන් අවස්ථාවේදී, 2017 ජනවාරි 11.

17. A Still Unfinished War, July 2015, http://www.itjpsl.com/reports/a-still-unfinished-war

18. ITJP මාධ්‍ය නිවේදනය: Trincomalee Torture Site, 20 November 2015, http://www.itjpsl.com/assets/press/20.11.15-Press-Release-TIJP-on-Trincomalee-Secret-Site-2.pdf; *Victims and witnesses: No protection, but persecution*, නාමිනී විජේදස, සන්ඩේ ටයිම්ස් පුවත්පත, 2016 ජූලි 31, 2016, http://www.sundaytimes.lk/160731/news/victims-and-witnesses-no-protection-but-persecution-202919.html

19. UNCAT, ශ්‍රී ලංකාව පිළිබඳ පස්වැනි වාරික වාර්තාවේ සමාප්ති නිරීක්ෂණ, 2015 දෙසැම්බර්

20. එම

අධිකාරියට පත් කොට ඇති පුද්ගලයන් දෙදෙනකු සම්බන්ධයෙන් බරපතල ප්‍රශ්න මතුවී තිබේ[21].

(අ) රාජපක්ෂ පාලනය වෙනුවෙන් සේවය කරන සමයේ බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධ තොරතුරු වසන් කළ බවට චෝදනා ලබන අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ ගේ අවංකභාවය සහ අපක්ෂපාතී කම පිළිබඳව ගැටළු මතු වී තිබේ. මේ ප්‍රශ්න මතු කර ඇත්තේ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් පමණක් නොවේ[22]. ජාත්‍යන්තර ස්වාධීන අද්විතීයයන් කණ්ඩායම (IIGEP) ට අරමුදල් සැපයූ මූල්‍ය සම්පාදකයන්ට දෙන ලද රහසිගත වාර්තාවකද ඒ බව සඳහන් වේ. එම ලියැවිල්ල ITJP විසින් අධ්‍යයනය කර තිබේ.

(ආ) නන්දන මුණසිංහ 2010 අප්‍රේල් මාසයේ කොළඹ අපරාධ පරීක්ෂණ අංශයට මාරුකර යවන තුරු දීර්ඝ කාලයක් ත්‍රස්ත විමර්ශන ඒකකයේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත. එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මැන්ෆ්‍රඩ් නොවැක් 2007 දී කොළඹදී පිළිගැනීම ට ත්‍රස්ත විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ ලෙසින් පැමිණි නිලධාරියා ඔහුය. රැඳවියන් තමන් හමුවීම වලක්වාලීම සඳහා නන්දන මුණසිංහගේ නියෝගයෙන් ඔවුන් මාරුකර යවා තිබුනු බව නොවැක් මහතා කියයි (25 ඡේදය). වධහිංසා කිරීමේ අපරාධ කරුවකු ලෙසින් චූදිත මුණසිංහ මහතා සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු බවත් ඔහු වැඩිදුරටත් පවසයි (13 ඡේදය, 30 පිටුව)[24]. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම අරමුණු කොටගෙන අලුතින් පිහිටුවන ලද ආයතනයකට ජනාධිපති සිරිසේනගේ ආණ්ඩුව විසින් මේ පුද්ගලයා පත් කිරීම බරපතල ප්‍රශ්න මතු කරන්නකි.රාජ්‍ය සේවා නිලධාරීන් ගේ සුලමුල සෙවීමට ආණ්ඩුව 2015 එක්සත් ජාතීන්ගේ යෝජනාවෙන් දුන් පොරොන්දුව මෙමගින් නැවත වතාවක් කඩ කොට ඇත.

---

21. *NA for protecting victims and witnesses set up*, 8 January 2016, Ceylon Times, අන්තර්ජාලයේ තවදුරටත් නොමැත. එහි සඳහන් පරිදි පත් කළවුන් අතර පහත දැක්වෙන අයද වෙති. "හමීඩ් ගසාලි හුසේන්, අතිරේක සොලිසිටර් ජනරාල් **යසන්ත කෝදගොඩ**, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශයේ අතිරේක ලේකම් නීල් හපුහින්න, කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්. යූ. පී. ප්‍රේමචන්ද්‍ර, සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (අපරාධ සහ මෝටර් රථ/ රථවාහන) **නන්දන මුණසිංහ**. සභාපති විශ්‍රාමික මහාධිකරණ විනිසුරු විමල් නම්බුවසම්ය. කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ පොදු සහ ජාත්‍යන්තර නීතිය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී එම්. ඒ. ඩී. එස්. ජේ. ශිරන්ජනී නිරිඇල්ල, ආචාර්ය නිමල් ප්‍රනාන්දු, නියෝජ්‍ය පොලිස්පති අශෝක විජේතිලක සහ නීතිඥ සංජීව සමරනායක අනිකුත් සාමාජිකයෝ වෙති."

22. *APPOINTMENT OF YASANTHA KODAGODA TO TORTURE COMMITTEE OF HRC-SL INAPPROPRIATE – AHRC,* Sri Lanka Brief, 22 September 2016, http://srilankabrief.org/2016/09/appointment-of-yasantha-kodagoda-to-torture-committee-of-hrc-sl-inappropriate-ahrc/

23 A/HRC/7/3/Add.6, වධහිංසා සහ අනෙකුත් කුරිරු, අමානුෂික හෝ අවමාන සහගත සැලකිලි හෝ දඬුවම් සම්බන්ධ එක්සත් ජාතින්ගේ විශේෂ නියෝජිත මැන්ෆ්‍රඩ් නොවැක් ගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ වාර්තාව http://www2.ohchr.org/english/bodies/hrcouncil/docs/7session/A.HRC.7.3.Add.6_ch.pdf

## 2. ITJP විසින් සම්මුඛ පරීක්ෂාවට ලක් කෙරුනු ලිංගික ප්‍රචණ්ඩතාවට ගොදුරුවූ කාන්තාවන්

### 2.1 පීඩිතයන්ගේ පැතිකඩ

**සමස්තය:** සිද්ධි 55 යි

**විවාහක අවිවාහක තත්වය**
විවාහක: 30
අවිවාහක: 22
වැන්දඹු: 2
වෙන්වූ: 1

**LTTE හා සම්බන්ධය**
සාමාන්‍ය වැසියන්: 20
LTTE යට බලහත්කාරයෙන් බඳවා ගන්නා ලද: 8
2009 ට කලින් LTTE හැරගිය: 5
LTTE: 22

**කාල රාමුව**

සාක්ෂිකාරියන් තෝරා ගැනීමේදී ITJP විසින් ප්‍රචණ්ඩතා ව්‍යාප්තියට වඩා විවිධ කාල වකවානු ඉලක්ක කරගැනීම කාල රාමුව මගින් පිළිබිඹු කෙරෙන බව සැලකිල්ලට ගත යුතුය.

කාන්තාවන් පහළොස් දෙනෙක් වසර ගණනාවක් තිස්සේ විවිධ ස්ථාන වල රඳවා තබා ගනු ලැබුවෝය, කිහිප වර පැහැරගෙන ගොස් කෙලෙසනු ලැබුවෝය.

ඉල්ලූ දේශපාලන රැකවරණ නොදී යුරෝපයෙන් පිටුවහල් කරනු ලැබූ කාන්තාවන් දෙදෙනකු සිරකොට තබාගෙන දූෂණය කර තිබේ. ITJP විසින් කාන්තාවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලද්දේ යුරෝපයේදීය.

2016: 1
2015: 6[25]
2014: 2
2013: 10
2012: 8
2011: 4
2010: 2
2009: 18
2008: 2
2007: 1
2006: 1

**යුද්ධය අවසානයේ භාරවූ/ අල්ලා ගන්නා ලද:** 19 (මැණික් ෆාම් කඳවුරෙන් ගෙනයන ලද අයද ඇතුළුව)

**පැහැරගන්නා ලද්දේ හෝ අත් අඩංගුවට ගන්නා ලද්දේ:** කොළඹ (8), නැගෙනහිර (3), වන්නි (9), මහනුවර (1), යාපනය අර්ධද්වීපය (5), නොදන්නා (2).

25 එක් කාන්තාවක් පැහැරගනු ලැබුවේ 2015 ට පෙර වුවත් 2015 දීත් රඳවාගෙන වද දෙනු ලැබුවාය.

**සිරකොට තබා ගැනීම සහ කෙලෙසීම සම්බන්ධයෙන් වගකිව යුතු බවට චෝදනා ලබන ආරක්ෂක අංශ සාමාජිකයන්:[26]**

යුද හමුදුව[27]: 30
පොලිසිය[28] (CID සහ TID ඇතුළුව): 24
නාවික හමුදුව: 2
කවර අංශය දැයි හඳුනා නොගත්: 7

## 2.1 රැඳවුම් වර්ග

### (i) පැහැරගැනීම්, වධහිංසා සහ ලිංගික දූෂණය

කාන්තාවන් අතරින් 29ක් සිවිල් ඇඳුමින් පැමිනි නිලධාරීන් විසින් වාහනයකින්[29] පැහැරගෙන, සිද්ධීන් 28 කදී නොදන්නා තැනකට ගෙන ගොස් තිබිනි. ඒ ස්ථාන බොහෝ අවස්ථාවලදී පැහැදිලිවම හමුද කඳවුරුය. නිදහස් කිරීමද සිදු කෙරුනේ පැහැරගත් විදියටම ඉන්නා ප්‍රදේශය හෝ ස්ථානය වසන් කිරීම පිණිස පීඩිත කාන්තාවගේ දෑස් වසා බඳිමිනි. මේ පැහැරගැනීමේ රටාව අපේ කලින් වාර්තාවලදී මැනවින් විස්තර කර තිබේ.

### (ii) "පුනරුත්ථාපන" සිද්ධි

සිද්ධි 10 ක් "පුනරුත්ථාපන කඳවුරුවල රඳවා සිටි හිටපු LTTE සාමාජිකාවන් ගැනය. එහිදී බොහෝවිට ලිංගික ප්‍රචණ්ඩතා සිදුකොට ඇත්තේ ඒ කඳවුරු වලින් වෙනත් ස්ථාන කරා ගෙන ගිය අවස්ථාවලදීය.

### (iii) පෙරමුණේදී, සීමා මුරපොලේදී හෝ භාරවීමේදී

සිද්ධි 2 කදී හමුද නිලධාරීන් විසින් කාන්තාවන් ලිංගික දූෂණයට ගොදුරු කරගෙන තිබුනේ යුද්ධාවසානයේ සීමා මුරපොලකදී හෝ පෙරමුණේ දී (වට්ටුවාක්කල් පාලම) භාර වන අවස්ථාවේදීය. වෙනත් අවස්ථාවල, භාරවීමේදී හෝ මැණික් ෆාම් කඳවුරේ සිටියදී ඔත්තුකරුවන් විසින් කාන්තාවන් හඳුනාගෙන රඳවා ගැනීමෙන් අනතුරුවය.

### (iv) අත් අඩංගුවට ගැනීම්/ පැහැර ගැනීම්

සිද්ධි 5 කදී කාන්තාවන් අත් අඩංගුවට ගනු ලැබුවේ පොලිස් ස්ථානයකට වාර්තා කරද්දී හෝ එහි යමින් හෝ එමින් සිටියදීය. පුල්මුඩේ පොලිස් ස්ථානයේදී TID නිලධාරීන් විසින් ලී මුගුරකින් ලිංගික දූෂණය කිරීම ගැන එක් කාන්තාවක් විස්තර කළාය. නම් කරන ලද වෙනත් පොලිස් ස්ථාන: ගල්කිස්ස, වවුනියාව, නෙල්ලිඅඩි පොලිසිය පසුපස CID කාමරය සහ කොළඹ CID/ TID මූලස්ථානය.

### (v) දූෂක කඳවුරු

පීඩිත කාන්තාවන් තුන් දෙනකු යුද හමුදුව විසින් දීර්ඝ කාලයක් තිස්සේ රඳවා තබාගෙන ලිංගික වහලියන් ලෙස පාවිච්චි කරන ලදී. මේ සිද්ධි විවිධ අවුරුදු (2007, 2009-13, 2012-15) වලදී නිශ්චිත ලෙස හඳුනාගත් ස්ථාන හතරකදී[30] සිදු වී ඇත. වව්නියාව අසල එකක්, පුත්තලම අසල එකක්, කොළඹ ම එකක් සහ කොළඹින් පිටත එහෙත් උතුරු නැගෙනහිර නොවූ තැනක එකක් වශයෙනි. එක් කාමරයක එකට රඳවා, ඕනෑම සොල්දදුවකුට පැමිණ තෝරාගෙන

---

26 සමස්ත සංඛ්‍යාව කාන්තාවන් සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ ඇතැමුන් ස්ථාන කිහිපයකම රඳවා තබා තිබූ නිසාය.

27 චූදිත අපරාධකරුවන් හමුද නිල ඇඳුම් හැඳ සිටි බව සාක්ෂිකාරියන් කී අවස්ථා.

28 සාමාන්‍ය ඇඳුමින් සිටි චූදිත අපරාධකරුවන් තමන් CID/TID ලෙස හඳුනා දුන් බව හෝ පොලිස් නිල ඇඳුමින් සිටි බව හෝ සාක්ෂිකාරියන් කී අවස්ථා.

29 සුදු, අලු හෝ කලු වෑන් රියකින් හෝ කලාතුරකින් ජීප් රියකින්.

30 කාන්තාවන් දෙදෙනෙක් ස්ථාන කීපයක අවුරුදු ගණනාවක් සිරකොට තබා තිබිනි.

යාබද කාමරයකට හෝ කුඩාරමකට ගෙන ගොස් දූෂණය කරන්නට ඉඩ සලසා තිබූ ආකාරය කාන්තාවන් දෙදෙනකු විසින් විස්තර කරන ලදී[31]. මහ කළුවරේ හය මාසයක් තනිව කාමරයක සිර කර සිටි තවත් තුන්වැනි කාන්තාවකට යාබද කාමරවල වෙනත් කාන්තාවන් කෑමොර දෙනු ඇසී තිබුණි[32]. සිද්ධි දෙකකදී ආරක්ෂක හමුද විසින් තමන්ට නිතිපතා පෙති හෝ එන්නත්[33] දුන් ආකාරය කාන්තාවන් විසින් විස්තර කරන ලදී. ඒ උපත් පාලනය සඳහා යයි ඔවුන් විශ්වාස කළේ තුන්වැනි සිද්ධියේදී දූෂණයට ගොදුරුවූ කාන්තාව ගැබ් ගත් හෙයිනි.

## 2.3 ස්ථාන

මැණික් ෆාම් අනාථ කඳවුර, සම්පත් නුවර හමුද කඳවුර (පුල්මුඩේට නුදුරින්), ජෝසප් කඳවුර (වන්නි ආරක්ෂක සේනා මුලස්ථානය) බූස්ස, ත්‍රිකුණාමලයේ ඕර්ස් හිල් හමුද කඳවුර, පලාලි කඳවුර, කනගපුරම් කඳවුර (වධහිංසා කර නැත) සහ චාවාකච්චේරි 512 කඳවුර ඇතුළු තවත් ස්ථානවල[35] යුද්ධයෙන් පසුව කාන්තාවන් සිරකොට තබාගෙන කෙලෙසා තිබේ. මේ, පම්පමඩු සහ පූන්තෝට්ටම් "පුනරුත්ථාපන" කඳවුරු සහ කලින් සඳහන් කළ පොලිස් ස්ථාන මෙන්ම රහසිගත/ නොදන්නා කඳවුරු 28 ට අමතරවය.

## 2.4 ලිංගික දූෂණය සහ වධබන්ධන

පුනරුත්ථාපන කඳවුරේදී තමන් දූෂණය කරන ලද බව හතර දෙනකු හැරුණු කොට අනික් සියලුම කාන්තාවෝ පැවසූහ. ඉන් දෙදෙනකු වෙනත් ආකාර වලින් ලිංගික වශයෙන් කෙලෙසන ලද අතර තුන් දෙනකු ඒ ගැන කතා කිරීමට කැමැත්තක් දැක්වූයේ නැත. ඒ අනුව, තමන් දූෂණය කරන ලද බව කියූ කාන්තාවන් ගණන 46 කි; ඒ බොහෝ දෙනකු අවස්ථා කීපයකදී අපරාධකරුවන් කිහිප දෙනකු විසිනි.

---

31 *"කාමරයට ආපු එක උසස් නිලධාරියකුට කැමති කෙනෙක් තෝරා ගන්න කිව්වා, හරියට අපි මස් කඩේක එල්ලලා තිබුණු මස් වගේ. මිනිහා වටේට බලලා මාව තෝරගත්තා. ඊට පස්සේ තවත් කාමරේකට ගෙනිහින් මාව දූෂණය කළා."*
*"මේ කඳවුරේ මාව තියාගෙන හිටිය අවුරුදු දෙකේදී මාව කී පාරක් දූෂණය කළාද කියා ගානක් කියන්න බෑ. මම පිරිසිදුව ඉන්නේ නැතිව කිලුටුවට, ගඳට ඉන්න උත්සාහ කළා. ඒත් කිසි වෙනසක් උනේ නෑ. ගොඩක් වෙලාවල ඒ මිනිස්සු මගේ කටේ හරි ඇඟේ හරි ධාතු යැව්වා. මට කොයි වෙලාවෙවත් ඒක කටට ගන්න පුළුවන් කමක් තිබුනේ නැති හින්ද එක්කෝ හුස්ම හිර උනා, නැතිනම් කෙල ගහන්න හැදුවා. ගොඩක් වෙලාවට ගුද මාර්ගය පාවිච්චි කළ නිසා ලේ යන්න ගත්තා. සමහර වෙලාවල මිනිස්සු ගොඩක් ඇවිත් මාවයි අනිත් අයයි හෝල් එකට හරි ඉස්තෝප්පුවට හරි කුස්සියට හරි ගෙනිහින් අපිව දූෂණය කළා."*
32 *"මට ගහලා, පයින් ගහලා දූෂණය කළා. කී වතාවක්ද කියලා මට ගානක් කියන්න බෑ. නිතරම වාගේ මාව දූෂණය කරන්න ආපු මිනිස්සු හතර පස් දෙනෙක්ගේ ගඳයි, ඇඟේ හැටියි මට මතකයි. ඒත් ඊට වැඩි ගානක් එන්න ඇති. මට ඇහුනේ වටේ කාමරවල හිටපු ගෑනුන්ගේ කටහඬ විතරයි. මගේ කාමරේ දෙපැත්තේම ගෑනු කටහඬ ඇහුනා. හුඟක් වෙලාවල අනික් කාමරවලින් කෑගහන සද්ද ආපු නිසා තවත් ගෑනු දූෂණය කෙරුනා කියලා මට විශ්වාසයි. ඒ ගොඩක් රස්නෙ වෙලාවක් වෙලාවක් හින්ද මම හිතන්නේ දවල් වරුවේ වෙන්න ඕනේ කියලයි."*
33 *"මිනිහෙක් නිතරම ඇවිල්ලා මට මුලදී ටින් එකකින් පෙති දෙකක් දුන්නා. පස්සේ එක ගානේ දුන්නා."*
34 *"උන් සිරින්ජරේ පුරවන හැටි මම බලා හිටියා. සිංහලෙන් ලියපු ලේබලයක් තියෙන වීදුරු කුප්පියක් අරගෙන අතින් හොලවනවා. ඒකේ තිබුනේ වතුර වගේ දියරයක්. කුප්පිය මුණින් අතට හරවලා කටුව යටින් ගහලා ටිකක් සිරින්ජරේට ගන්නවා. හුඟක් වේලාවට තවත් කුප්පියකිනුත් ඒ වගේම ගන්නවා. බෙහෙත් දෙකක් කලවම් කරනවාද නැතිනම් මුලින් බෝතලෙන් උවමනා තරමට ගන්න බැරිවුනු හින්දද කියලා මට කියන්න බෑ."*
35 *කාන්තාවන්ගේ අනන්‍යතාව හෙළි විය හැකි හෙයින් ඒ නම් ඉවත් කරන ලදී.*

**2.5 අල්ලස්**
කාන්තාවන් 42 ක් නිදහස ලැබුවේ රඳවාගෙන සිටියවුන්ට ඥාතීන් විසින් අල්ලස් ගෙවනු ලැබීමෙනි. 11 ක් අල්ලස් නොදීම නිදහස ලැබූ අතර දෙදෙනකු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත හැකි වූයේ නැත.

**3. හඳුනාගනු ලැබූ අපරාධකාරී පුද්ගලයන්**

(අ) අණදෙන නිලධාරීන් ලෙසින්, සහ/ හෝ (ආ) සෘජු අපරාධකරුවන් ලෙසින් හෝ (ඇ) සාපරාධී සහායකත්වයෙන් දෙමළ කාන්තාවන් (සහ පිරිමින්ටත්) වධහිංසා කිරීමට හා ලිංගික වශයෙන් දූෂණය කිරීමට සම්බන්ධ වීමේ චෝදනාවට ලක්වන හමුදා නිලධාරීන් කණ්ඩායමක් ITJP විසින් හඳුනාගෙන තිබේ. ඒ තොරතුරු වලට පදනම් වී ඇත්තේ සාක්ෂිකාරියන් සහ දිවි ගලවා ගත්තවුන් ගේ දිවුරුම් ප්‍රකාශයි.

**3.1 චෝදනා ලබන අපරාධකරුවන්ගේ අනන්‍යතාව**
මේ ලියැවිල්ල සමග දෙනු ලබන **රහසිගත** ඇමුණුමේ ඡායාරූප හයක් තිබේ. වග උත්තරකරුවන්ගේ අයිතිය ආරක්ෂා කිරීම සඳහාත්, සැකකරුවන්ට කල්තියා දැනගැනීමට ලැබීමෙන් තොරව විශ්වසනීය ලෙස එවැනි සිද්ධි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ඇති දේශපාලන අභිලාෂය සහ හැකියාව කාන්තාවන්ට එරෙහි වෙනස්කම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව (CEDAW) කමිටුවට විදහා දැක්වීමේ අවස්ථාවක් ආණ්ඩුවට ලබා දීම පිණිසත්, නම්, ඒකක සහ ඡායාරූප වල රහස්‍යභාවය ITJP විසින් රකිනු ලැබේ.

**3.2 ඔවුන් චෝදනා ලබන අපරාධ**
දූෂකයන් ලෙස චෝදනා එල්ලවන ශ්‍රී ලංකා යුද හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තුන් දෙනකු ඔවුන්ට ගොදුරු වූ කාන්තාවන් දුන් දිවුරුම් ප්‍රකාශ මගින් නම් කොට ඇත. මින් එක අයකු මෑතදී එක්සත් ජාතීන්ගේ සාම සාධකයකු ලෙස සේවය කර තිබේ. හතරවැනි නිලධාරියකු සෘජුවම වද දීමට සම්බන්ධ බවට චෝදනා ලබයි. පස්වැනියකු වධ බන්ධනයට අණ දුන් බවට චෝදනා ලබයි. වින්දිත කාන්තාවකට වධහිංසා කරද්දී වධකාගාරයට ඇතුල් වූ බවට හයවැන්නකු චෝදනා ලබයි.

**4. නිර්දේශ**

**4.1 කාන්තාවන්ට එරෙහි වෙනස්කම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව (CEDAW)**
අපරාධ සම්බන්ධ චූදිතයන් ගැන ITJP සැපයූ රහස්‍ය තොරතුරු CEDAW විසින් ශ්‍රී ලංකාවේ රජයට ලබා දිය යුතුය. ඒ, සෝදිසි කිරීම සහ සුලමුල සෙවීම සඳහාය. එම තොරතුරු (අ) සේවය අත් හිටුවීම සහ (ආ) මේ පුද්ගලයන් කිසියම් නිල තනතුරක් හෝ එක්සත් ජාතීන්ගේ සාමසාධක තනතුරක් හිමි කර ගැනීම සම්බන්ධයෙන් සුලමුල සෙවීම සඳහා (ඇ) ඔවුන් සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීම අරමුණු කරගත් පූර්ණ විමර්ශනයක් කරන තුරු යොදගන්නේදැයි CEDAW විසින් මැනවින් නිරීක්ෂණය කළ යුතුය.

ශ්‍රී ලංකාවේ අලුත් ආණ්ඩුව යටතේ දිගටම කෙරෙමින් පවතින කෙලෙසීම් වලට අදළව ITJP ඇතුළු ශ්‍රී ලංකාවෙන් පිටත කණ්ඩායම් අත ඇති සාක්ෂි විභාග කර බැලීම සඳහා ස්වාධීන කණ්ඩායමක් ජිනීවා නුවර ස්ථාපිත කරන මෙන් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට නිර්දේශ කරන මෙන් අපි CEDAW වෙතින් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටින්නෙමු.

**4.2 ශ්‍රී ලංකාවේ ආණ්ඩුව**
කාන්තාවන් (සහ පිරිමින්) ලිංගික වධයට පැමිණවීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධයක් වන හෙයින්, ඒ සම්බන්ධයෙන් වග කිව යුතු හමුදා නිලධාරීන්ගේ වගවීම තහවුරු කිරීමට දෙමුහුන් හෝ වෙනත් ආකාරයක අධිකරණ

යාන්ත්‍රණයක් පිහිටුවන තුරු බලා සිටීමට ශ්‍රී ලංකා රජයට හේතුවක් නැති බව අපේ අදහසයි.

පහත දැක්වෙන කාරණා ඉෂ්ඨ කොට එහි ප්‍රගතිය CEDAW වෙත වාර්තා කරන මෙන් CEDAW විසින් ශ්‍රී ලංකාවේ රජයෙන් ඉල්ලා සිටිය යුතු බවට ITJP නිර්දේශ කරයි.

- වධහිංසා කිරීම සහ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් සාපරාධී දයකත්වයක් දරන මෙම හමුද නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා යුද්ධයේ අවසාන භාගයේ ඊට වගකිව යුතු බවට චෝදනා ලබන සහ/හෝ දැනටත් උතුරු නැගෙනහිර සේවයේ යෙදී සිටින හමුද ඒකක වලින් ස්වාධීන වූ හමුද විශේෂඥයන්ගෙන් සමන්විත කාර්ය සාධක කණ්ඩායමක් හෝ කමිටුවක් පිහිටුවීම. චූදිතයන්ගේ හමුද වාර්තා ලබාගැනීමේ නිර්බාධිත ඉඩ ප්‍රස්තාවත්, වධකාගාර වලට ඇතුල්වීමේ මෙන්ම මුහුණු හඳුනාගැනීමේ මෘදුකාංග සහ නීත්‍යානුකූලව ලබාගත් දුරකතන පණිවිඩ ලබාගැනීමේ ඉඩකඩත් ඔවුන්ට සලසා දිය යුතුය. විමර්ශනය පවත්වන සියලුම නිලධාරීන්ගේ සත්‍යවාදී බව හඳුනාගැනීමේ මාසික විද්‍යුත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. විමර්ශකයන්ගෙන් අඩක් දෙමළ විය යුතු අතර මනා කාන්තා නියෝජනයක් තිබිය යුතුවාක් මෙන්ම අවදනම් සහගත තත්වයක සිටින සහ ක්ෂතියෙන් පීඩා විඳින සාක්ෂිකාරියන්ගෙන් ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් ප්‍රකාශ ලබාගැනීමේ විශේෂඥතාව සහිත ලිංගික භාවය පිළිබඳ එක් නිලධාරියකු හෝ සිටිය යුතුය.
- සාක්ෂි තිබෙන අවස්ථාවලදී, ස්වාධීන පාරදෘශ්‍ය විමර්ශනයක් පවත්වා රහසිගත හමුද අධිකරණ මගින් නොව සිවිල් අධිකරණ පද්ධතිය යටතේ ඔවුන්ට අධිචෝදනා නගා නඩු පැවරිය යුතුය.
- අධියාචනා පත්‍ර වැනි ක්‍රම යොදගැනීම මගින් විදේශගත සාක්ෂිකාරියන්ගෙන් ද සුරක්ෂිතව හා රහසිගත භාවය රැකෙන ආකාරයෙන් ප්‍රකාශ ලබා ගැනීමට පහසුකම් සැලසීම ද ඇතුළුව සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සැලසීම. අනන්‍යතාව හෙළි නොකර සිටීම සහතික කළ නොහැකි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලදී සාක්ෂි දීමට පීඩිතයන්ට සිදු නොවිය යුතුය. මෙය අත්‍යාවශ්‍ය වන්නේ සාක්ෂිකාරියන්ගේත්, ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ ඥාතීන්ගේත් ආරක්ෂාව සඳහා පමණක් නොවේ; බොහෝ අයගේ සැමියන් හා දරුවන් සාක්ෂිකාරියන් දූෂණයට ගොදුරු වූ බව නොදන්නා නිසා ඒ කාන්තාවන්ගේ අනන්‍යතාව සඟවා තබා ගැනීම පිණිසය.
- රහසිගත ඇමුණුමේ දැක්වෙන නිලධාරීන් හය දෙනාගේම සේවය විමර්ශනයේ තීන්දුව ලැබෙන තුරු අත් හිටුවීම.
- විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව CEDAW වෙත නිතිපතා වාර්තා කිරීම.

සහාය ලබා දීම සඳහා ජාත්‍යන්තර කණ්ඩායමක් ගොණු කර දෙන බවට ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරයාට ITJP දුන් පොරොන්දුව නැවත සිහිපත් කරන්නෙමු. ඒ සම්බන්ධයෙන් ඔහු තවමත් ප්‍රතිචාර දක්වා නැත.

**4.3 මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වරයා**

මේ පුද්ගලයන් හය දෙනා ගේ වගවීම තහවුරු කිරීම සම්බන්ධ ප්‍රගතිය අධීක්ෂණය කරනු ඇතැයි අපේක්ෂාවෙන්ද, ඒ කිසිවකුත් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වල යොද නොගැනීමට සාමසාධන මෙහෙයුම් කාර්යාලය විසින් වගබලාගැනීම සඳහාද මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාටත් ITJP විසින් මේ ලියැවිල්ලට අමුණා ඇති රහසිගත තොරතුරු භාරදී තිබේ.

**4.4 ආණ්ඩු**

පුහුණු පාඨමාලා සහ වීසා සඳහා ලැබෙන අයැදුම්පත් සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවල සුපරීක්ෂාව සඳහාත්, ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධයෙන් ගත් කල, 2016 මැග්නිට්ස්කි පනත යටතේ සම්බාධක පැනවීම

සඳහාත් මොවුන් හා වෙනත් අපරාධ චූදිතයන් සම්බන්ධ තොරතුරු විදේශීය ආණ්ඩු වෙත ලබා දීමටත් ITJP අපේක්ෂා කරයි.

නිමි.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT